ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ආදායම් කළමනාකරණ කමිටුව

**ප්‍රසිද්ධ නිවේදනයයි**

# රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ උපායමාර්ග සඳහා යෝජනා කැඳවීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා මධ්‍යකාලීන හා දිගුකාලීන උපායමාර්ග සැකසීමට දායක වීමට හැකි **විද්වත් මණ්ඩල (think tanks), වෘත්තීය ආයතන, ශාස්ත්‍රීය ආයතන, පෞද්ගලික අංශය, ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන, සහ උනන්දුවක් දක්වන ඕනෑම ශ්‍රී ලාංකීය පුරවැසියෙකුට**, ඒ සඳහා සුදුසු යෝජනා, ප්‍රතිපත්තිමය නිර්දේශ සහ විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කරන ලෙස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ආදායම් කළමනාකරණ කමිටුව මෙයින් ආරාධනා කරනු ලැබේ.

**පසුබිම:** රාජ්‍ය ආදායම් උපායමාර්ග සම්පාදනය කිරීම, ආදායම් උපදවන රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය ඉහළ නැංවීම සහ ආදායම් ඉහළ නැංවීමට මාර්ගෝපදේශ ලබාදීම සඳහා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ආදායම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී. මෙම කමිටුවේ කාර්යභාරයේ එක් කොටසක් ලෙස, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, බදු පදනම පුළුල් කිරීම සහ අවිධිමත් ආර්ථිකය විධිමත් කිරීම හරහා රජයේ ආදායම **දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) සියයට 20** දක්වා ඉහළ නැංවීමේ රජයේ මධ්‍ය හා දිගුකාලීන අරමුණ කරා ළඟාවීමට අවශ්‍ය දත්ත හා තොරතුරු මත පදනම් වූ යෝජනා ඉදිරිපත් කරන ලෙස, ආදායම් කළමනාකරණ කමිටුව සියළුම පාර්ශ්වයන්ගෙන් ඉල්ලා සිටී.

### යෝජනාවල විෂයපථය

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් (නමුත් ඒවාට පමණක් සීමා නොවී) යෝජනා ඉදිරිපත් කළ හැකිය:

- රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා මධ්‍යකාලීන හා දිගුකාලීන උපායමාර්ග;
- අවිධිමත් ආර්ථිකය විධිමත් කිරීම සහ බදු පදනම පුළුල් කිරීම;
- කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ආදායම් රැස්කරන ආයතන ඩිජිටල්කරණය කිරීම;
- ප්‍රතිපත්තිවලට අනුකූල ආදායම් රැස්කිරීමේ ක්‍රමවේද;
- ස්වේච්ඡාවෙන් බදු ගෙවීම දිරිමත් කිරීම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම;
- දත්ත විශ්ලේෂණය සහ තාක්ෂණය පදනම් කරගත් ආදායම් පද්ධති භාවිතය; සහ
- ආදායම් පරිපාලනය සහ බදු ප්‍රතිපත්ති සම්බන්ධ ජාත්‍යන්තරව පිළිගත් භාවිතයන්.

## සුදුසුකම්

මෙම යෝජනා කැඳවීම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති ලියාපදිංචි විද්වත් මණ්ඩල, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, වෘත්තීය ආයතන, පෞද්ගලික අංශයේ ආයතන, ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධාන සහ ඕනෑම ශ්‍රී ලාංකීය පුරවැසියෙකු සඳහා විවෘත වේ.

## යෝජනා ඉදිරිපත් කිරීමේ දී සපුරාලිය යුතු අවශ්‍යතා

යෝජනා PDF ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතු අතර පහත කරුණු ඇතුළත් විය යුතුය:

- යෝජිත ආදායම් උපායමාර්ග, ප්‍රතිසංස්කරණ හෝ ප්‍රතිපත්තිමය පියවර පිළිබඳ සාරාංශයක්;
- යෝජිත උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය;
- අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය සහ/හෝ පරිපාලනමය බලපෑම;
- යෝජිත ආදායම් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා පවතින අවදානම්; සහ
- ආයතනයක් නම්, ලියාපදිංචි නම සහ අදාළ ශ්‍රී ලාංකීය අධිකාරිය විසින් නිකුත් කරන ලද අංකය සහ, ශ්‍රී ලාංකික පුරවැසියෙකු නම්, ජාතික හැඳුනුම්පත් අංකය ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

යෝජනා ඉදිරිපත් කළ යුතු අවසාන දිනය

**2026 ජූනි 12**

## යෝජනා ඉදිරිපත් කළ යුතු ආකාරය

සියලුම යෝජනා PDF ආකෘතියෙන් (Format) පහත විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතුය:

ආදායම් කළමනාකරණ කමිටුව,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 01.

විද්‍යුත් තැපෑල: **dgfp@fpd.treasury.gov.lk**
දු.ක. අංකය: +94 112 484 648

*ඕනෑම යෝජනාවක් පිළිගැනීමේ, ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගැනීමේ පූර්ණ අයිතිය ආදායම් කළමනාකරණ කමිටුව සතු වේ. තෝරාගනු ලබන ආයතනවලට හෝ පුද්ගලයින්ට තම යෝජනා පැහැදිලි කිරීම සඳහා ආදායම් කළමනාකරණ කමිටුවේ ඉදිරි රැස්වීමකට සහභාගී වන ලෙස ආරාධනා කරනු ලැබිය හැකිය.*

**ආදායම් කළමනාකරණ කමිටුව**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**
දිනය: **2026** මැයි **24**